ගොඩකවෙල ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන.

------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 18 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 24 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූනි 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය.

--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පුස්තකාලය හා සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලද ණය මුදල සඳහා ගලපා තිබූ ප්‍රාග්ධන පොළී රු. 618,972 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) සභාව සතු බැකෝ යන්ත්‍රය සභාවේ සංවර්ධන කටයුතු සඳහා යෙදවීම මඟින් රු. 1,949,795 ක්ද, කුළියට දීම මඟින් රු. 467,650 ක්ද, ලෙස එකතුව රු. 2,417,445 ක ආදායම් හඳුනාගෙන ඇතත්, සමාලෝචිත වර්ෂයේදී වාණිජ ගිණුමෙන් ප්‍රධාන ගිණුමට ගලපා ඇති ආදායම රු. 2,004,260 ක් වූයෙන් රු. 413,185 ක ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 48,600 ක් වියදම් සඳහා ණයහිමියන් යටතේ වෙන් කිරීම් කර නොතිබුණි.

1.3.2 ගෙවිය යුතු ගිණුම්

ණයහිමි ශේෂය තුල පවතින සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂයන්හි සිට පවතින රු. 506,477 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 9,779,362 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,073,126 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 3,072 | 3,151 | 623 |
| බදු කුලී | 8,001 | 7,828 | 306 |
| බලපත්‍ර ගාස්තු | 593 | 1,061 | 95 |
| වෙනත් ආදායම් | 13,500 | 14,614 | 8,719 |

2.2.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය
------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී වරිපනම් හා බදු සහ බදුකුළී රැස්කළ ආදායම්, ඇස්තමේන්තුගත ආදායමට වඩා අඩුවීමක් පෙන්නුම් කලද, සමස්ථ ආදායම රැස්කිරීමේ දී සියයට 10.33 ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි.

2.2.3 වරිපනම් බදු
----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟ වරිපනම් බදු ලෙස විගණිත දිනය වූ 2015 පෙබරවාරි 25 දින වනවිට බදුකරුවන් 558 දෙනෙකුගෙන් රු. 363,903 ක් එනම්, සියයට 88 ක ප්‍රතිශතයක් අයවීමට තිබූ අතර, ඉන් රත්නපුර ප්‍රධාන පාර දෙපස බදුකරුවන් 405 දෙනෙකු ගෙන් රු. 322,812 ක හිඟයක් විය. තවද, සියයට 82 ක ප්‍රතිශතයක් වූ රු. 1,000 ට වඩා වැඩි වරිපනම් බදු ගෙවීම් පැහැර හරින ලද බදුකරුවන් 83 දෙනෙකුගේ හිඟ ශේෂ රු. 297,949 ක් විය.

(ආ) රක්වාන උප කාර්යාලය අයත් වන බල ප්‍රදේශයේද බදුකරුවන් 326 දෙනෙකුගෙන් රු. 248,087 ක් 2014 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබුණි. රු. 2,000 ට වඩා වැඩි වරිපනම් බදු ගෙවීම පැහැර හරින ලද බදුකරුවන් 25 දෙනෙකුගේ හිඟ ශේෂය රු.69,695 ක් විය.

2.2.4 බලපත්‍ර ගාස්තු

----------------

සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු අයකල යුතු ව්‍යාපාර හඳුනාගැනීම උදෙසා වාර්ෂික සමීක්ෂණයක් විගණිත දිනය වූ 2015 පෙබරවාරි 25 දින වනවිටද සිදුකර නොතිබූ අතර, ආයතනයට ව්‍යාපාර වර්ගය අනුව එකතුවන ආදායම පදනම් කරගෙන ආදායම් ලේඛණ පවත්වා තිබුණි.

2.2.5 ජල ගාස්තු

-------------------

සභාව මඟින් පාලනය වන රක්වාන ජල යෝජනා ක්‍රමයේ පාරිභෝගිකයින් 267 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. 108,821 ක හිඟ මුදලක් අයවීමට තිබූ අතර, ඉන් 54 දෙනෙකුගෙන් රු. 500 ට වඩා වැඩියෙන් අයවීමට තිබුණි. මෙම ජල ව්‍යාපෘතිය සඳහා සේවකයින් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණද, බොහෝ ජල සැපයුම් වලට ජල මනු සවිකිරීම හා විධිමත් නඩත්තුවක් සිදු නොවන බවත්, හිඟ ජල බිල්පත් අයකර ගැනීම උදෙසා ප්‍රශස්ථ වැඩ පිළිවෙලක් ස්ථාපිත වී නොමැති බවත්, විගණනයට නිරීක්ෂණය විය.

2.2.6 අක්කර බදු

----------------

2014 දෙසැම්බර් 31 දිනට පුද්ගලයින් 244 දෙනෙකු වෙතින් හිඟ අක්කර බදු ලෙස රු. 57,906 ක් අයවීමට තිබූ අතර, ඉන් රු. 30,902 ක්වූ සියයට 53 ක ප්‍රතිශතයක් රු. 500 කට වඩා වැඩි හිඟ මුදලක් ගෙවීමට ඇති 27 දෙනෙකුගේ හිඟ ශේෂ බව නිරීක්ෂණය විය. තවද, රක්වාන උප කාර්යාලයේ අක්කර බදු ලේඛණය අනුව 2014 දෙසැම්බර් 31 දිනට බදුකරුවන් 54 ක ගෙන් රු. 22,726 ක අක්කර බදු අයවීමට තිබුණි.

2.2.7 උසාවි දඩ

--------------

සමාලෝචිත වර්ෂය අවසානයට ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙතින් ලැබිය යුතු උසාවි දඩ ආදායම් 2013 ජූලි මාසයෙන් පසුද, පැල්මඩුල්ල මහේස්ත්‍රාත් අධිකරණය වෙතින් 2014 දෙසැම්බර් මාසය සඳහාද හඳුනාගෙන ලේඛණගත කර නොතිබුණි.

2.2.8 දේපල බදු දීම

------------------

(අ) 2009 මාර්තු 09 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක පා.පා.කො./2009/07 දරන චක්‍රලේඛ විධිවිධාන පරිදි වසර 05 කට වරක්වත් තක්සේරුගත බදු කුළිය සංශෝධනය කල යුතුය. 2009 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද තක්සේරුවද

නොසලකා චක්‍රලේඛ ප්‍රකාරව වර්තමානයේ නැවත තක්සේරුවක් ලබා ගැනීමකින් තොරව සභා තීරණයක් මත පදනම්ව තක්සේරු මුදලට වඩා අඩු මුදලකට සභාව සතු වෙළඳසැල් 2015 වර්ෂයේදීද බදුදී තිබුණි.

(ආ) දේපල බදු දීමේදී පා.පා.කො./ඒ/01 හා 1998 දෙසැම්බර් 10 දිනැති ලිපිය මඟින් හඳුන්වා දී ඇති ආදර්ශ ගිවිසුම් ආකෘති පත්‍රය ප්‍රකාර ගිවිසුමකට එළඹිය යුතු අතර, වාර්ෂිකව බදු ගිවිසුම අළුත් කිරීමට පියවර ගත යුතු බව දන්වා තිබුණි. කෙසේවෙතත් ප්‍රාදේශීය සභාව හා කඩහිමියන් අතර, වාර්ෂිකව ගිවිසුම්ගත වීමක් සිදු වී නොතිබූ අතර, අදාල කඩහිමියන් වෙතින් අයවිය යුතු සංශෝධිත කඩකුළිය පිළිබඳව දැනුම් දීම පමණක් සිදු කර තිබුණි. 2013 වර්ෂයෙන් පසු පරීක්ෂණ අවස්ථාව වූ 2015 පෙබරවාරි මාසය දක්වා සංශෝධිත කුළී අයකර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

සේවක ණය ලේඛණය අනුව ස්ථාන මාරු ලැබූ නිළධාරීන් හා සේවකයින් 03 දෙනෙකුගෙන් රු. 50,000 ක මුදලක් ලැබිය යුතු තිබුණි.

### 3.2 අවිධිමත් ගනුදෙනු

----------------------

2009 දෙසැම්බර් 22 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක ප.පා.කො.1/2009 (සංශෝධන) දරන චක්‍රලේඛයේ දෙවන ඡේදයේ පරිදි පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා සභිකයින් සඳහා සංයුක්ත දීමනා ගෙවිය හැකි වන්නේ අදාල පළාත් පාලන ආයතන බල ප්‍රදේශයෙන් පිටත පරිපාලන කටයුතු වලට ඍජුවම සම්බන්ධ රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා ගිය ගමන් බිමන් සඳහා පමණක් වුවද, තම රාජකාරිය හෝ රාජකාරිය සඳහා වන අනුමැතිය පිළිබඳ කිසිඳු සඳහනකින් හෝ තහවුරු කිරීමකින් තොරව 2014 වර්ෂයේ සංයුක්ත දීමනා වශයෙන් රු. 92,500 ක් සභිකයින්ට සභා අරමුදලින් ගෙවා තිබුණි. එම ගමන් පිළිබදව වන අවශ්‍යතාවය හෝ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (LRC) සතු සභාව විසින් දීර්ඝකාලීනව භුක්තිවිඳින බලවින්න ඉඩම (ගොවිපළ) ගොවිපළක් වශයෙන් සංවර්ධනය කර තිබුණද එහි ආදායම් තත්ත්වයෙහි සීඝ්‍ර අඩු වීමක් පවතින බව නිරීක්ෂණය විය. තවද, ගොවිපළේ ආදායම් හා නඩත්තුව සම්බන්ධයෙන් ප්‍රශස්ථ අධීක්ෂණ ක්‍රියාවලියක් සිදු නොකරන බවද මේ හේතුවෙන් එය සභාවට අහිමි වීමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.4 පාරිසරික ගැටළු

------------------

දැනට ස්ථිර ලෙසම සභා බල ප්‍රදේශයට අයත් බවට තීරණය කර ඇති මාදම්පේ මාළු වෙළඳපල සම්බන්ධයෙන් සක්‍රීය මැදිහත්වීමක් සභාව වෙතින් සිදු නොවන අතර, යෝජිත මාළු වෙළඳසැල සංකීර්ණ භූමිය සැකසීමේ කටයුතු ආරම්භ කලද එය මේ වනවිට අතරමඟ නැවතී තිබුණි. අදාල ස්ථානයේ මාළු වෙළඳසැල් හිමියන් විසින් ප්‍රධාන පාර අසල ඉවතලන අපද්‍රව්‍ය හේතුවෙන් ප්‍රදේශවාසීන්ට දැඩි දුෂ්කරතාවයන්ට මුහුණදීමට සිදු වී තිබුණි.

ඒ අනුව එම ස්ථිර වෙළඳ සංකීර්ණය ඉදිවන තෙක් දැනට පවතින මාළු වෙළඳපල මහජනතාවට හා පරිසරයට වඩා හිතකර ලෙස පවත්වාගෙන යාම සඳහා මැදිහත්විය යුතු සභාව වෙතින් එකී වගකීම ඉටු නොවන බවත්, සභාවේ ප්‍රමුඛ ආදායම් ප්‍රභවයක් ලෙස වර්ධනය කරගතහැකි මෙම මාළු වෙළඳපොලින් මේ වනවිට කිසිඳු ආදායමක් සභාව වෙත නොලැබෙන බව පමණක් නොව එය සභාවේ අධීක්ෂණයෙන් බැහැරව පවතින බවත්, විගණනයට නිරීක්ෂණය විය.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

අයවැය පාලනය

-------------------

වැය විෂයයන් 07 කට අදාලව සමාලෝචිත වර්ෂයේ සලසා තිබූ ප්‍රතිපාදනයෙන් රු. 2,581,641 ක් කිසිඳු වියදමක් නොදරා ඉතිරි වී පැවතුණි.

5. පද්ධති හා පාලන

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය